ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE

මගේ අංකය / எனது இல. / My Ref. CSS/03/01/පොදු-covid19/2020 ඔබේ අංකය / உமது இல / Your Ref. දිනය / திகதி / Date 2021.09.17

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්/සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්.
දකුණු පළාත.

**<u>දකුණු පළාත් කාර්යාල සේවාවන් කාර්යක්ෂම කිරීම .</u>**

පවත්නා කොරෝනා වසංගත තත්ත්වය හමුවේ සාමාන්‍ය තැපැල ක්‍රියාත්මක වීම ප්‍රමාද වීම හා අතින් ගෙන යන (By hand) ලිපි භාරදීම පිළිබඳ මතුවී ඇති ගැටලුකාරී තත්වයන් මත කාර්යාල කටයුතු වල ප්‍රමාද වීම් සිදුවන බව මා වෙත නිරීක්ෂණය වී ඇත.

02. මේ අනුව එකී ගැටලු නිරාකරණය කිරීම සඳහා හැකි සෑම අවස්ථාවකම පහත සියලු මාර්ග මගින් ලිපි යොමු කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දැනුම් දෙමි.

1) ඊ තැපැල (E – mail)
2) කෙටි පණිවිඩ මගින් (SMS/ Whatsapp)
3) Fax
4) සාමාන්‍ය තැපැල/ අතින් භාර දීම

03. හැකි සෑම අවස්ථාවකදීම ජනාධිපති ලේකම් චක්‍රලේඛ අංක SP/SB/01/13 ( පිටපත අමුණා ඇත.) අනුව කඩදාසි භාවිතය අවම විද්‍යුත් සන්නිවේදන ක්‍රම පවත්වාගෙන යාමට කටයුතු කළ යුතු අතර, ඊ තැපැල, කෙටි පණිවිඩ සේවා හා Fax පණිවිඩ, නිකුත් කිරීම හා ලැබීම් පිළිබඳව වෙනම ලේඛණයක් පවත්වා ගැනීමටත්, ලිපි නිකුත් කළ පසු අදාල පාර්ශවයන් වෙත එය ලැබුනු බවට තහවුරු කර ගැනීමටත්, කටයුතු කළ යුතුය.

04. කෙසේ වුවත් දෛනික ලිපි ගනුදෙනු සම්බන්ධව කාර්යාල ක්‍රම භාවිතය හා ගොනු කළමනාකරණය සාමාන්‍ය පරිදි ක්‍රියාත්මක කළ යුතු බවත්, වැඩි දුරටත් දන්වමි.

ආර්.සී.ද සොයිසා
ප්‍රධාන ලේකම්
දකුණු පළාත.

ආර්. සී. ද සොයිසා
ප්‍රධාන ලේකම්
දකුණු පළාත